**සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතිය - 2019**

--------------------------------------------------

සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සමායතනය අතර, 2016 දෙසැම්බර් 28 දින එළඹි අංක 5915-එල් කේ දරණ ණය ගිවිසුමේ IIබී (3) පරිච්ඡේදය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

--------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය මෙන්ම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය ද ලෙස, එවකට මුදල් අමාත්‍යාංශය ලෙසින් පැවතුණු දැනට මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය ක්‍රියාත්මක වේ. ශ්‍රී ලංකාව තුළ දුප්පත් හා අවදානමට ලක්විය හැකි කණ්ඩායම්වල ප්‍රයෝජනය සඳහා සමාජ ආරක්ෂණ ජාල වැඩසටහන්වල සමානාත්මතාව, කාර්යක්ෂමතාව හා විනිවිදභාවය වැඩිදියුණු කිරීම සඳහා දායක වීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් සංරචක 03 කින් සමන්විත වන අතර, ව්‍යාපෘති මෙහෙයුම් අත්පොතෙහි 4.2.3 ඡේදයට අනුව, ව්‍යාපෘතියේ මතය ඉදිරිපත් කිරීමේ වාර්තා, එක් එක් සංරචකයේ කාර්යසාධනය මත පදනම්ව වෙන් වශයෙන් ඉදිරිපත් කළ යුතු වේ. මෙම ණය ගිවිසුම අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය, එක්සත් ජනපද ඩොලර් මිලියන 75 කට සමාන රුපියල් මිලියන 11,212.50 ක් වී තිබුණු අතර, ව්‍යාපෘතියේ සම්පූර්ණ පිරිවැයම ජාත්‍යන්තර සංවර්ධන සමායතනය විසින් ලබාදීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු 2017 ජනවාරි 01 දින ආරම්භ කර තිබුණු අතර, එය 2022 මාර්තු 31 දින වනවිට අවසන් කිරීමට නියමිතව ඇත.

## 1.3 මතය

----------

මාගේ මතය අනුව මේ සමඟ ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශනයන් තුළින්, 2019 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය තත්ත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ මතයක් පිළිබිඹු කෙරෙන අතර සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශය ද පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කර ඇත.

## 1.4 මතය සඳහා පදනම

------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් වන විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැලසීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත වන බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

-----------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

------------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හා වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ. මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැක මුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද:

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීම වංචාවක් ඇති වීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත් අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල කලමනාකරණය විසින් කරන ලද සාධාරණත්වය හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර, ඒ සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

--------------------------------------------

## 2.1 නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම.

--------------------------------------------------

| නීති, රීති සහ රෙගුලාසි සඳහා යොමුව | අනුකූල නොවීම් ගැටළුව | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| මුදල් රෙගුලාසි අංක 757 | රුපියල් මිලියන 14.26 ක පිරිවැයකට මිලදීගත් දේපළ, පිරියත සහ උපකරණ පිළිබඳව පැවැත්විය යුතු භාණ්ඩ සමීක්ෂණ කටයුතු, සමාලෝචිත වර්ෂය තුළදී සිදුකර නොතිබුණි. | ව්‍යාපෘතියේ කළමනාකරණ අධීක්ෂණ ඒකකය තුළ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ස්ථානගතව පවතින එකී වත්කම්වල පැවැත්ම පිළිබඳව විගණනයේදී තහවුරු කරගත නොහැකි විය. | භාණ්ඩ සමීක්ෂණ කටයුතු, මුදල් අමාත්‍යාංශය මගින් සිදුකර තිබුණු අතර, එම වාර්තාව 2020 පෙබරවාරි 13 දින වාර්ෂික විගණනය සඳහා ලබාදී ඇත. | මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා දී ඇති දේපළ, පිරියත සහ උපකරණවල පැවැත්ම තහවුරු කිරීම සඳහා භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදුකළ යුතු වේ. |

## 3. භෞතික කාර්යසාධනය

----------------------------

## 3.1 ව්‍යාපෘතියේ ක්‍රියකාරකම්වල භෞතික සහ මූල්‍ය ප්‍රගතිය

---------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් සංරචක 03 ක් යටතේ ක්‍රියාත්මක වේ. එනම්,

(අ) ඒකාබද්ධ සමාජ ලේඛනාධිකාරයක් ගොඩනැගීම.
(ආ) ඒකාබද්ධ සේවා සැපයුම් පද්ධතියක් හඳුන්වාදීම සහ
(ඇ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය සහ සැලසුම් කිරීම සඳහා සහාය වීම.

ලබාදී ඇති තොරතුරුවලට අනුව ව්‍යාපෘතියේ සමස්ථ භෞතික ප්‍රගතිය සතුටුදායක නොවන මට්ටමක පැවතුණි. ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | සංරචක | ක්‍රියාකාරකම් | විගණන ගැටළු | බලපෑම් | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශයන් |
|---|---|---|---|---|---|---|
| | ----------- | ---------------- | ---------------- | ----------- | ------------------- | ----------------- |
| (i) | ඒකාබද්ධ සමාජ ලේඛනාධිකාරයක් ගොඩනැගීම. | සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලය පිහිටුවීම සහ පූර්ණ ලෙස ක්‍රියාත්මක කිරීම. | 2017 වර්ෂයේදී සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලය පිහිටුවා තිබුණද; එය අපේක්ෂිත පරිදි ක්‍රියාත්මක වී නොතිබුණි. මණ්ඩලයේ සභාපතිවරයා 2019 දෙසැම්බර් 06 දින සිය ධූරයෙන් ඉල්ලා අස්වී තිබුණු බව තවදුරටත් අනාවරණය වූ අතර, නව සභාපතිවරයෙකු පත්කිරීමේ කටයුතු විගණිත දිනය වූ 2020 මැයි 26 දින වනවිටත් සිදුකර නොතිබුණි. | අපේක්ෂිත ප්‍රතිලාභ පාර්ශවකරුවන් වෙත නොලැබෙනු ඇත. | එකඟ වේ.<br>රාජ්‍ය ව්‍යවසාය මණ්ඩල, රජය සතු සමාගම් සහ ව්‍යවස්ථාපිත ආයතනවලින් ඉල්ලා අස්වීම සඳහා භාණ්ඩාගාර ලේකම්වරයා විසින් කරන ලද ඉල්ලීම හේතුවෙන් සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ සභාපතිවරයා ඉල්ලා අස්වී තිබුණි. තවදුරටත් ව්‍යවස්ථාදායක සභාවේ අනුමැතිය මත පදනම්ව, සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ සභාපතිවරයාගේ පත්කිරීම සිදුකර තිබුණි. එම හේතුවෙන් නව ව්‍යවස්ථාදායක සභාවේ අනුමැතිය ලැබෙනතෙක් සභාපති තනතුර සඳහා පත් කිරීම් සිදු නොකෙරේ. | සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ සුමට ක්‍රියාකාරිත්වය සහතික කිරීම සඳහා සභාපතිවරයකු පත් කිරීමට සහ ප්‍රධාන තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා කඩිනම් පියවර ගත යුතු වේ. |
| (ii) | ඒකාබද්ධ සමාජ ලේඛනාධිකාරයක් ගොඩනැගීම. | සුභසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ වැඩසටහන්වලට ඇතුළත්වීම, අනුමත කිරීම, ප්‍රකාශයට පත්කිරීම හා ඉන් ඉවත්වීම සම්බන්ධයෙන් විධිමත් | විගණිත දිනය වූ 2020 මැයි 26 දින දක්වාම, නව සුභසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමය සඳහා පාර්ලිමේන්තුවෙන් සහ නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබාගැනීමට | සමාලෝචිත වර්ෂය තුළදී ජාත්‍යන්තර සංවර්ධන සමායතනය මගින් ණය වාරික මත ඇමරිකානු ඩොලර් මිලියන 2.5 ක මුදලක් නිකුත් කරනු | 2019 නොවැම්බර් මස තුළදී පාර්ලිමේන්තුව විසුරුවා හැරීම හේතුවෙන් නියාමනය කරන ලද යෝජනා ක්‍රමය අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට නොහැකි වී තිබුණි. | සුභසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට අදාළ ගැසට් නිවේදනය අනුමත කිරීම සඳහා අදාළ පාර්ශවයන් වෙත බලපෑම් කිරීමට පියවර ගත යුතුය. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | ප්‍රතිපත්තියක් සකස් කිරීම. | ව්‍යාපෘතියට නොහැකි වී තිබුණි. | නොලබන බැවින් අපේක්ෂිත ප්‍රතිලාභ ද අපේක්ෂිත පාර්ශවයන් වෙත නොලැබෙනු ඇත. | | |
| (iii) | ඒකාබද්ධ සමාජ ලේඛනාධිකාරයක් ගොඩනැගීම. | ක්‍රියාකාරී සමාජ ලේඛනාධිකාර තොරතුරු පද්ධතියක් ක්‍රියාත්මක කිරීම. | ලබාදී ඇති තොරතුරුවලට අනුකූලව සමාජ ලේඛනාධිකාර තොරතුරු පද්ධතිය සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් වූ කොන්ත්‍රාත්තුව 2017 ඔක්තෝබර් 31 දින පෞද්ගලික පාර්ශවයක් වෙත ප්‍රදානය කර තිබුණු අතර, එය 2018 මාර්තු 31 දින වනවිට අවසන් කිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේ වෙතත් මෙම මෘදුකාංග සංවර්ධන ක්‍රියාකාරකම නිම කිරීමට විගණිත දිනය වූ 2020 මැයි 26 දින දක්වාම නොහැකි වී තිබුණි. | අදාළ කොන්ත්‍රාත්තුවේ කාලසීමාව දීර්ඝ කළ යුතුව තිබුණු බැවින්, ව්‍යාපෘතියේ සමස්ථ කාලසටහන් සැලසුම්වලටද ඉන් බලපෑම් ඇතිවිය හැකිව තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ජාත්‍යන්තර සංවර්ධන සමායතනය විසින් ඇමරිකානු ඩොලර් මිලියන 08ක මුදලක් සමාලෝචිත වර්ෂය තුළදී නිකුත් කර නොතිබුණි. | සමාජ ලේඛනාධිකාරි තොරතුරු පද්ධතිය සංවර්ධනය කිරීමේ කටයුතු 2019 දෙසැම්බර් 31 දින වනවිට නිමකර තිබුණි. | සමාජ ලේඛනාධිකාර තොරතුරු පද්ධතිය සංවර්ධනය කිරීමේ කටයුතු නිමකර ඇති බව සනාථ කිරීම සඳහා සාක්ෂි නොමැති බැවින් ඒකාබද්ධ සමාජ ලේඛනාධිකාරයක් පිහිටුවීම සඳහා කඩිනම් පියවර ගත යුතු වේ. |
| (iv) | ඒකාබද්ධ සමාජ ලේඛනාධිකාරයක් ගොඩනැගීම. | සුභසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ වූ සුභසාධක වැඩසටහන් අයවැය | සමාජ ලේඛනාධිකාර තොරතුරු පද්ධතිය සංවර්ධනය කිරීමේ කටයුතු සම්පූර්ණ නොකිරීම හේතුවෙන් සහ නව සුභසාධන ප්‍රතිලාභ යෝජනාක්‍රමය සඳහා | ජාත්‍යන්තර සංවර්ධන සමායතනය විසින් සමාලෝචිත වර්ෂය තුළදී ඇමරිකානු ඩොලර් මිලියන 03 ක මුදලක් ණය | දත්ත සංක්‍රමණය කිරීමේ ක්‍රියාවලිය (සමෘද්ධි, ආබාධිත, වැඩිහිටි සහ වකුගඩු සම්බන්ධයෙන් වූ) දැනට ක්‍රියාත්මක වෙමින් පවතියි. ඉහත සංක්‍රමණ ක්‍රියාවලිය අවසන් වූ වහාම දත්ත තහවුරු | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාකාරකම් පිළිබඳව වගකිව යුතු පාර්ශවයන් දැනුවත් කිරීමට සහ සමීප |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | පාර්ලිමේන්තු අනුමැතිය ලබාගැනීම ප්‍රමාද වීම හේතුවෙන්, සමාලෝචිත වර්ෂය තුළදී මෙම ක්‍රියාකාරකම ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි. | වාරික ලෙස නිකුත් කර නොතිබුණි. | කර ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කළ යුතු වේ. සමාජ ලේඛනාධිකාරි තොරතුරු පද්ධතිය හරහා දත්ත තහවුරු කර ගැනීමේ ක්‍රියාවලියේ නිර්ණායක පරීක්ෂා කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාල 04 ක් තෝරාගෙන ඇත. | අධීක්ෂණයක් පවත්වා ගෙන යාම සඳහා කටයුතු කළ යුතු වේ. |
| (v) | ඒකාබද්ධ සේවා සැපයුම් පද්ධතිය | සුභසාධන ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ වන වැඩසටහන්වල ප්‍රතිලාභීන් පිළිබඳ වර්තමාන දත්තවලින් සමන්විත සමාජ ලේඛනාධිකාරයක් ගොඩනැගීම. | සමාජ ලේඛනාධිකාරි තොරතුරු පද්ධතිය සංවර්ධනය කිරීමේ කටයුතු සම්පූර්ණ නොකිරීම හේතුවෙන්, දත්ත ඇතුළුකිරීමේ ක්‍රියාවලිය මෙතෙක් ආරම්භ කර නොතිබුණි. | ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් අවසන් කිරීමේ කටයුතු, ප්‍රමාදයන් සහිතව සිදුවිය හැක. සමාලෝචිත වර්ෂය තුළදී ජාත්‍යන්තර සංවර්ධන සමායතනය විසින් ඇමරිකානු ඩොලර් මිලියන 04 ක මුදලක් ණය වාරික ලෙස නිදහස් නොකිරීමට නොකරනු ඇත. | සමාජ ලේඛනාධිකාරි තොරතුරු පද්ධතිය සංවර්ධනය කිරීමේ කටයුතු 2019 දෙසැම්බර් 31 දින වනවිට නිම කිරීමට නොහැකි වී තිබුණි. දත්ත සංක්‍රමණය කිරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක මට්ටමේ පවතියි. | වගකිව යුතු පාර්ශවයන් දැනුවත් කිරීම සඳහා පියවරගත යුතු වන අතර, ව්‍යාපෘතිය විසින් ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම් පිළිබඳව සමීප අධික්ෂණයක් සිදුකළ යුතු වේ. |
| (vi) | ඒකාබද්ධ සේවා සැපයුම් පද්ධතිය | සුදුසුකම් සම්බන්ධයෙන් වූ නිර්ණායක පදනම් කරගෙන, සුභසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභීන් තෝරා ගැනීම. | 2019 ජූනි 20 දින ප්‍රකාශයට පත්කරන ලද ගැසට් පත්‍රයේ අදාළ සුදුසුකම් සම්බන්ධයෙන් වූ නිර්ණායකයන් පිළිබඳව සඳහන් කර තිබුණද, මෙම ගැසට්පත්‍රය | අපේක්ෂිත පාර්ශවයන්ට අපේක්ෂිත ප්‍රතිලාභ නොලැබෙනු ඇති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ජාත්‍යන්තර සංවර්ධන සමායතනය විසින් | පාර්ලිමේන්තුව විසුරුවා හැරීම හේතුවෙන් ගැසට් පත්‍රය අනුමත කරගෙන නොතිබුණු අතර, උපයෝජනය හා බැඳුණු දර්ශක වෙනස් කොට එම ලේඛනය ප්‍රතිව්‍යුහගත කොට තිබුණි. | වගකිව යුතු පාර්ශවයන් දැනුවත් කිරීම සඳහා පියවර ගත යුතුවන අතර, ව්‍යාපෘතිය විසින් ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම් |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | පාර්ලිමේන්තුව විසින් අනුමත කර නොතිබුණි. නිර්ණායක පදනම් කරගත් තෝරාගැනීම් ක්‍රමය ක්‍රියාත්මක කිරීම මෙතෙක් ආරම්භ කර නොතිබුණි. | ඇමරිකානු ඩොලර් මිලියන 05 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුළදි ණය වාරික ලෙස නිදහස් කර නොතිබුණි. | | පිළිබඳව සමීප අධීක්ෂණයක් කළ යුතු වේ. |
| (vii) | ඒකාබද්ධ සේවා සැපයුම් පද්ධතිය | ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් වැඩසටහන් සම්පාදනය සඳහා ඒකාබද්ධ කළමනාකරණ තොරතුරු පද්ධතිය යොදා ගැනීම. | සමාජ ලේඛනාධිකාරී තොරතුරු පද්ධතිය සම්පූර්ණ නොවීම හේතුවෙන් විගණිත දිනය වූ 2020 මැයි 26 දින දක්වාම මෙම ක්‍රියාකාරකම ආරම්භ කර නොතිබුණි. | ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් අවසන් කිරීමේ කටයුතු සැලකිය යුතු ප්‍රමාදයන් සහිතව සිදුවිය හැකිව තිබේ. එහි ප්‍රතිඵලයක් ලෙස සමාලෝචිත වර්ෂය තුළදී ජාත්‍යන්තර සංවර්ධන සමායතනය ඇමරිකානු ඩොලර් මිලියන 06 ක මුදලක් ණය වාරික ලෙස නිදහස් කර නොතිබුණි. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය 332 කින්, දිස්ත්‍රික් ලේකම් කාර්යාල 92 ක් තාක්ෂණික පුහුණු කටයුතු සඳහා සුදුසුකම් සපුරා තිබුණි. සුභසාධක ප්‍රතිලාභී තොරතුරු ඒකකවලට අනුයුක්ත නිලධාරීන් 184 දෙනෙකු පුහුණු කොට ඇත. කොවිඩ් වසංගත තත්ත්වය හේතු කොටගෙන ඉතිරි පුහුණු සැසි පසුව පැවැත්වීමට කටයුතු කර ඇත. | වගකිව යුතු පාර්ශවයන් දැනුවත් කිරීම සඳහා පියවර ගත යුතු අතර, ව්‍යාපෘතිය විසින් ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම් පිළිබඳව සමීප අධීක්ෂණයක් කළ යුතු වේ. |

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය**

---------------------------

| | විගණන ගැටළු<br>----------------- | බලපෑම්<br>---------- | කළමනාකරණයේ අදහස් දැක්වීම්<br>-------------------- | විගණකගේ නිර්දේශයන්<br>-------------------- |
|---|---|---|---|---|
| (i) | ලබාදී ඇති තොරතුරුවලට අනුව පවත්නා සමාජ ආරක්ෂණ උපායමාර්ග සහ ශ්‍රී ලංකාවේ ජාතික සමාජ ආරක්ෂණ උපායමාර්ග | අපේක්ෂිත ප්‍රතිලාභ පාර්ශවකරුවන් වෙත නොලැබෙනු | එකඟ වේ.<br>විවිධ කරුණු හේතු කොටගෙන ජාතික සමාජ ආරක්ෂණ උපායමාර්ග සංවර්ධන | මේ සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන් දැනුවත් කිරීම සඳහා පියවර ගත යුතු අතර, |

| | | | | |
|---|---|---|---|---|
| | සංවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන 141 ක පිරිවැයක් සහිත කොන්ත්‍රාත්තුවක් 2019 ජනවාරි 22 දින උපදේශන සේවා සමාගමක් වෙත පවරා තිබුණු අතර, එම කොන්ත්‍රාත්තුව 2019 සැප්තැම්බර් 01 දින වනවිට අවසන් කිරීමට නියමිත වී තිබුණි. ලැබී ඇති තොරතුරුවලට අනුව විගණිත දිනය වූ 2020 මැයි 26 දින දක්වාම අදාළ වැඩ කටයුතු සම්පූර්ණ කර නොතිබුණි.<br><br>කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂය අවසාන දින වනවිට අදාළ උපදේශන සමාගම වෙත රුපියල් මිලියන 1.46 ක මුදලක් ගෙවා නිම කොට තිබුණි. | ඇත. | කිරීමේ කටයුතු ප්‍රමාද වී ඇත. නමුත් කොන්ත්‍රාත්තු වටිනාකම රුපියල් මිලියන 14.1 ක් ලෙසට නිවැරදි කළ යුතු වේ. මල්ටිටෙක් සොලියුෂන්ස් ආයතනය වීන් සපයන ලද කෙටුම්පත් තක්සේරු වාර්තාව සමාලෝචනය කිරීම සඳහා මාස හතරකට වැඩි කාලයක් ගත වී ඇත. ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් මෙම කටයුත්තේ ඇති හිඩැස් හඳුනාගෙන තිබුණු අතර, එම නිරීක්ෂණ පිළිබඳව වූ අදහස්, උපදේශකවරුන් හා සමාලෝචන කමිටුව සමඟ ඒකාබද්ධ වූ පොදු මණ්ඩපයක්දී හැකි ඉක්මණින් සාකච්ඡා කළ යුතු වේ. | ක්‍රියාකාරකම් කඩිනම් කිරිමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ii) | සමාජ ලේඛනාධිකාරි තොරතුරු පද්ධතියට දත්ත රැස් කිරීම සඳහා ව්‍යාපාරවල අඛණ්ඩ පැවැත්ම සහ ආපදා ප්‍රතිසාධන සැලසුම් සකස් කිරීම වෙනුවෙන් පිළියෙල කරන ලද කොන්ත්‍රාත්තුවක්, රුපියල් මිලියන 6.25 ක ඇස්තමේන්තුගත පිරිවැයකට තනි පුද්ගල උපදේශකයෙකු වෙත පිරිනමා තිබුණි. අදාළ කොන්ත්‍රාත් ගිවිසුමට අනුව එම වාර්තාව 2019 පෙබරවාරි 14 දින වනවිට ඉදිරිපත් කළ යුතුව තිබුණි. කෙසේ වෙතත් ඉන් මාස 05 ක ප්‍රමාද කාලයකින් පසුව 2019 ජූලි 08 දින වාර්තාව ඉදිරිපත් කර තිබුණි. එසේ වුවද, සමාජ ලේඛනාධිකාර තොරතුරු පද්ධතිය සංවර්ධනය කිරීමේ කටයුතු සම්පූර්ණ කර නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසාන වනවිට රුපියල් මිලියන 4.36 ක මුදලක් අදාළ උපදේශකවරයා වෙත ගෙවා තිබුණි. | අපේක්ෂිත ප්‍රතිලාභ ලබාගැනීමට නොහැකි වී තිබුණි. | එකඟ වේ.<br>2019 ජූලි 09 දින මෙම වාර්තාව ලබාදී තිබුණු අතර, රුපියල් මිලියන 2.5 ක ගෙවීම 2019 ජූලි 24 දින සිදුකර තිබුණි. | කොන්ත්‍රාත් ගිවිසුමේ අවශ්‍යතාවයන්ට අනුකූල වන පරිදි කටයුතු කිරීම සඳහා කොන්ත්‍රාත්කරුවන්ට බලපෑම් කිරීමට පියවර ගත යුතුය. |

## 3.3 ස්ථානීය පරීක්ෂණ වාර්තා සම්බන්ධයෙන් වූ නිරීක්ෂණ

| විගණන ගැටළු | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- |
| රුපියල් මිලියන 1.7 ක් වැය කොට සමාජ තොරතුරු ලේඛනාධිකාර පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා සිදුකරන ලද තාක්ෂණික පුහුණු වැඩසටහන්වලට සහභාගි වූ නිලධාරින්ගෙන් වැඩි පිරිසක් වෙනත් දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශවලට ස්ථාන මාරුවීම් ලබාගොස් තිබුණු බැවින්. එම පුහුණු වැඩසටහන් ඵල රහිත වී තිබුණු බව කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල කිහිපයක ෙසිදුකරනු ලැබූ ස්ථානීය විගණන පරීක්ෂණවලදී අනාවරණය වී තිබුණි. | නිශ්කාර්ය වියදම් | සමාජ තොරතුරු ලේඛනාධිකාර පද්ධතිය කළමනාකරණය කිරීම සඳහා සමාජ සුභසාධන තොරතුරු ඒකකය වෙත සේවයට කැපවූ නිලධාරින් පත්කිරීමට ව්‍යාපෘති තාක්ෂණික කමිටුව මගින් තීරණය කර තිබුණි. තවද ඒ සඳහා තිරසාර විසඳුමක් පවත්වා ගැනිම සඳහා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය සමඟ ද සාකච්ඡාවක් පවත්වා තිබුණි. | ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් නිසි පරිදි සැලසුම් කළ යුතු වේ. |

## 3.4 ඌණ උපයෝජිත සම්පත්

| | විගණන ගැටළු | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| (i) | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික ඒජන්සිය හරහා රුපියල් මිලියන 29 ක පිරිවැය වටිනාකමක් සහිත ලැප්ටොප් පරිගණක 332 ක් මිලදීගෙන, 2017 වර්ෂය තුල ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත බෙදාහැර තිබුණු නමුත් සමාජ තොරතුරු ලේඛනාධිකාර පද්ධතිය සම්පූර්ණ කර නොතිබීම හේතුවෙන් ඉන් අපේක්ෂා කරන ලද කාර්යයන් ඉටුකර ගැනීම සඳහා භාවිතා | (අ) වෙනත් අරමුණු සඳහා මෙම ලැප්ටොප් පරිගණක භාවිතා කිරීමේ සම්භාවිතාවයක් ඇතිවිය හැක.<br><br>(ආ) ප්‍රසම්පාදනය කරන ලද වත්කම්, අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම සඳහා | ලැප්ටොප් පරිගණක ප්‍රසම්පාදනය කිරීම සහ භාරදීම සම්බන්ධයෙන් ව්‍යාපෘතියේ කිසිදු මැදිහත්වීමක් සිදුවී නොමැත. සමාජ තොරතුරු ලේඛනාධිකාරි පද්ධතිය සංවර්ධනය කිරීම වෙනුවෙන් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් එම පද්ධතියට | ප්‍රාදේශිය ලේකම් කාර්යාල සමඟ නිසි ආකාරයේ සම්බන්ධීකරණයක් පවත්වා ගත යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| | කිරීමට නොහැකි වී තිබුණි. තවද, ඉහත පරිගණක සඳහා ලබාදී තිබූ වගකීම් කාලය ද පරිගණක භාවිතා කිරීමකින් තොරවම ඉකුත් වී තිබුණි. | යොදාගෙන නොමැත. | ප්‍රවේශවීමට අවශ්‍ය සම්පත් ලබාදීම වෙනුවෙන් අවශ්‍ය කටයුතු ඉටු කර ගැනීම සඳහා මුදල් අමාත්‍යාංශය විසින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික ඒජන්සිය වෙත අරමුද් ප්‍රතිපාදනය කර තිබුණි. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික ඒජන්සිය විසින් ලැප්ටොප් පරිගණක 332 ක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමට සපයා දී තිබුණි. මෙම ලැප්ටොප් පරිගණක සහ ඊට අදාළ වගකීම් කාලය ඇතුළත් තොරතුරු, ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ භාරයේ පවතියි. සමාජ ආරක්ෂණ දැල් ව්‍යාපෘතිය මගින් පවත්වනු ලබන පුහුණු සැසවලදී, සමාජ සුභසාධන තොරතුරු ඒකකයට අනුයුක්ත නිලධාරින් විසින් එම ලැප්ටොප් පරිගණක භාවිතා කෙරෙන බව අප විසින් නිරීක්ෂණය කරන ලදී. තවද ඔවුන් වෙත භාරදී ඇති ලැප්ටොප් පරිගණක පිළිබඳ වාර්තා අප විසින් ද පවත්වාගෙන යනු ලබයි. | |
| (ii) | ව්‍යාපෘති මෙහෙයුම් අත්පොතෙහි සඳහන් කොට ඇති මූල්‍යමය ඉලක්කවලට අනුව සමාලෝචිත වර්ෂය අවසාන දින වනවිට | වගකීම් කාලය අවසන් වනවිට ප්‍රතිපාදනය කරන ලද සම්පූර්ණ අරමුදල් ප්‍රමාණයම | 2020 මාර්තු සහ මැයි මාසවලදී පිළිවෙලින් ඇමරිකානු ඩොලර් මිලියන 05 ක් සහ ඇමරිකානු | ව්‍යාපෘති ඇගයීම් අත්පොතෙහි දක්වා ඇති ඉලක්කවලට අනුගත වීමට පියවර ගත යුතු |

| | | | |
|---|---|---|---|
| එක්සත් ජනපද ඩොලර් මිලියන 31 කට සමාන රුපියල් මිලියන 5,622.78 ක මුදලක් ලබාදීමට අපේක්ෂා කර තිබුණු නමුත්. එම ඉලක්කයෙන් සියයට 08 ක ප්‍රතිශතයක් පමණක්, එනම් එක්සත් ජනපද ඩොලර් මිලියන 2.5කට සමාන රුපියල් මිලියන 457.95 ක ඉලක්කයක් පමණක් 2019 දෙසැම්බර් 31 දින වනවිට ලඟා කරගෙන තිබුණි. | උපයෝජනය කිරීමට නොහැකි වනු ඇත. | ඩොලර් මිලියන 45 ක් ලැබී තිබුණු අතර, ඒ අනුව සියයට 72 ක සමුච්චිත ප්‍රගතියක් පෙන්නුම් කෙරේ. | වේ |

**3.5 ප්‍රසම්පාදන කළමනාකරණය**

-------------------------------------

| විගණන නිරීක්ෂණ | බලපෑම් | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| ---------------------- | ----------- | --------------------- | -------------------------- |
| සමාජ ආරක්ෂණ තොරතුරු ඒකක සඳහා බහුකාර්ය ඡායාපිටපත් යන්ත්‍ර 331 ක් සැපයීම, ස්ථාපිත කිරීම, ක්‍රියාත්මක කිරීම, පරීක්ෂා කිරීම, පුහුණු කිරීම සහ ලැප්ටොප් පරිගණක 356 ක් සැපයීම සහ පරීක්ෂා කිරීම සම්බන්ධයෙන් වූ ප්‍රසම්පාද කටයුතු සමාලෝචිත වර්ෂය තුළදී අවලංගු කර තිබුණි. | ඉන් අපේක්ෂිත ප්‍රතිඵලවලට සහ ව්‍යාපෘතියේ (ප්‍රතිඵල) Outcome කෙරෙහි බලපෑම් ඇතිකරනු ඇත. | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් අසාළ උපකරණ අන්තර්ජාලය හරහා ක්‍රියාත්මක කරවීමට නියමිතව තිබුණි. සමාජ ලේඛකාධිකාර තොරතුරු පද්ධතිය ස්ථාපනය කිරීමේ ප්‍රමාදය හේතුවෙන් ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව විසින් මෙම ප්‍රසම්පාදන කටයුත්ත අත්හිටුවීමට තීරණය කර තිබුණි. | සැලසුමට අනුව ක්‍රියාකිරීමට පියවර ගත යුතුය. |

### 3.6 ව්‍යාපෘති කළමනාකරණ ඒකකයට අදාළ ගැටළු

| ප්‍රධාන කාර්ය මණ්ඩල තනතුර | ව්‍යාපෘති කළමනාකරණ සේවා ඒකකයේ සේවා කාලය | වෙනත් ආයතනවල සේවයේ නියුතු වී සිට ඇත්ද යන බව | බලපෑම් | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|
| ව්‍යාපෘති අධ්‍යක්ෂ | 2018 මැයි මස සිට මේ දක්වා | ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය | ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ඉටුකිරීමේ කටයුතුවලට බලපෑම් සිදුවිය හැක. | ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනයේ සභාපති තනතුර, ස්ථිර තනතුරක් නොවේ. | චක්‍රලේඛ උපදෙස් වලට අනුගත විය යුතු වේ. |

### 3.7 මානව සම්පත් කළමනාකරණයට අදාළ ගැටළු

| තනතුරු නාමය | අනුමත තනතුරු සංඛ්‍යාව | 2019 දෙසැම්බර් 31 දිනට | | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| | | තථ්‍ය තනතුරු සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | | | |
| සමාජ ආරක්ෂණ ධාරිතා සංවර්ධන කළමනාකරු | 01 | 00 | 01 | (අ) ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ | • අයදුම්පත් කැඳවීම සහ සම්මුඛ පරීක්ෂණ | ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය සුමටව පවත්වා |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| තොරතුරු තාක්ෂණ කළමනාකරු | 01 | 00 | 01 | අධීක්ෂණය කිරීම නිසි ආකාරයෙන් සිදුකළ නොහැකි විය හැක. | පැවැත්වීම මැතිවරණ රෙගුලාසිවලට අනුකූලව සිදුකරන ලදී. | ගැනීම සඳහා කාර්ය මණ්ඩල සාමාජිකයන් බඳවා ගැනීම චක්‍රලේඛ උපදෙස් අනුව සිදුකළ යුතු වේ. |
| සමාජ ආරක්ෂණ මාර්ග සංවර්ධන නිලධාරි | 01 | 00 | 01 | (ආ) මෙම ප්‍රධාන තනතුරු 07 හි පුරප්පාඩු පිරවීමට අපොහොසත් වීම හේතුවෙන් ව්‍යාපෘතියේ කාර්යසාධනයට බලපෑම් ඇතිවිය හැකි වේ. | • බඳවාගැනීම් 2020 ජනවාරි මාසයේදී සිදුකරන ලදී.<br>• අයදුම්පත් කැඳවීම සහ සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම මැතිවරණ රෙගුලාසිවලට අනුකූලව සිදුකරන ලදී. | |
| සංවර්ධන නිලධාරි | 01 | 00 | 01 | | | |
| සන්නිවේදන නිලධාරි | 01 | 00 | 01 | | | |
| රියදුරු | 04 | 02 | 01 | | • බඳවාගැනීම් 2020 මාර්තු මාසයේදී සිදුකරන ලදී. | |
| එකතුව | 09 | 02 | 07 | | • රියදුරන් දෙදෙනෙකු ප්‍රමාණවත් වේ.<br>• සේවක තනතුරු සංඛ්‍යාව සංශෝධනය කළ යුතු වේ. | |

| විගණන ගැටළු<br>----------------- | බලපෑම<br>------------ | කළමනාකරණයේ අදහස් දැක්වීම<br>-------------------- | විගණකගේ නිර්දේශය<br>------------- |
| --- | --- | --- | --- |
| ව්‍යාපෘතිය සඳහා ස්ථිර පදනම මත ව්‍යාපෘති අධ්‍යක්ෂවරයෙකු පත්කර තිබුණු අතර, ඔහු වෙත 2018 ජූනි මස සිට 2019 දෙසැම්බර් 31 දින කාලයට අදාළ වැටුප් ලෙස රුපියල් මිලියන 3.97 ක මුදලක් ගෙවා තිබුණි. තවද ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනයේ සභාපතිවරයා ලෙස කටයුතු කරන ලද සේවාව අවසන් කිරීමකින් තොරව ඉහත කාලපරිච්ඡේදය සඳහාම තවත් රුපියල් මිලියන 1.79 ක මුදලක් ඔහු විසින් වැටුප් ලෙස ගෙන තිබුණු බවද විගණනයේදී නිරීක්ෂණය විය. | ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ඉදිරියට ක්‍රියාත්මක කිරීමේ කටයුතුවලට දැඩි ලෙස බලපෑම් එල්ල වී ඇත. | කළමනාකරණ චක්‍රලෙඛ අංක 01/2019 හි පරිච්ඡේද අංක 2.2.4 මත පදනම් කොටගත් කැබිනට් මණ්ඩල තීරණයක ප්‍රතිඵලයක් ලෙස, පූර්ණකාලීන ව්‍යාපෘති අධ්‍යක්ෂවරයෙකු පත් කර තිබුණි. ඔහුගේ ධුරකාලසීමාව 2019 මැයි 23 දින සිට ඉදිරියට දීර්ඝ කිරීමද කැබිනට් මණ්ඩලය විසින් 2019 ජූලි 19 දින අනුමත කර තිබුණි.ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනයේ (එන්.අයි.එල්.ඊ.ටී.) සභාපතිවරයා ලෙස වූ පත්වීම පී.ඊ.ඩී.චක්‍රලේඛ අංක 03/2015 මත පදනම්ව සිදු කර ඇති අතර, ඔහුට දීමනා ලබාගැනීම සඳහා ද සුදුසුකම් ඇත.<br><br>ව්‍යාපෘති අධ්‍යක්ෂ තනතුර හා සමගාමීව සභාපති තනතුර සඳහා ගෙවීම් ලබාගැනීම වෙනුවෙන් වෙන් වශයෙන් ලිපි දෙකක් නිකුත් කර ඇත.<br><br>මෙම තනතුරු දෙකෙන්ම ගෙවීම් ලබාගැනීම සම්බන්ධයෙන් උපදෙස් අපේක්ෂාවෙන් 2018 ජූලි 31 දිනැති ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත එක් ලිපියක් යවා තිබුණි. | චක්‍රලේඛ උපදෙස් වලට අනුකූලව කටයුතු කළ යුතු වේ. |

ඉහත සඳහන් කරුනම විමසමින් 2019 සැප්තැම්බර් 23 දිනැතිව ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත දෙවැනි ලිපිය යවා තිබුණි. ඒ සඳහා කිසිදු පිළිතුරු ලබාදීමක් මෙතෙක් සිදුවී නොතිබුණි.

ඒ අනුව ශ්‍රී ලංකාවේ කැබිනට් මණ්ඩලය මගින් අනුමත කරන ලද ව්‍යාපෘති අධ්‍යක්ෂ තනතුර සහ ඉන් අනතුරුව සිදුකරන ලද දීර්ඝ කිරීම්ද සලකා බලා ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා වෙත කරනු ලබන ගෙවීම් කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 ට අනුකූලව ඉටු කිරීමට අප හට සිදුව ඇත.